**පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---

පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2013 මැයි 08 දින එළඹි අංක 2892 - එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) ii ව්‍යවස්ථාව හා අංක 0303 - එස්ආර්අයි (ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුම සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘති ගිවිසුම් අනුව, විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 කොටස සිට 06 කොටස දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වගකීම දරන අතර ව්‍යාපෘතියේ 07 කොටස ක්‍රියාත්මක කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගකීම දරයි. ලංකා විදුලි බල මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ 01 කොටස සිට 06 කොටස යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පිවිතුරු විදුලි බලය සැපයුම වැඩිකිරීම හා ශ්‍රී ලංකාවේ විදුලි බලය බෙදාහැරීම් කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,240 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර ඉන් රු.මිලියන 16,595.30 කට සමාන එජඩො මිලියන 131.50 ක් හෙවත් සියයට 66 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද  වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ව්‍යාපෘති හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**--------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ව්‍යාපෘති හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

**---------------------------------------**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 ජුනි 24 දිනදීය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පාදුක්ක සහ පොල්පිටිය උපපොළවල් ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 02 ක් අත්කර ගැනීමට හෝමාගම හා අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තබා ඇති එකතුව රු.මිලියන 25.44 ක් වූ තැන්පතු, අත්තිකාරම් යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැය කරන ලද රු.මිලියන 3.29 ක ඉඩම් මැනීම් පිරිවැය ප්‍රාග්ධනිත කරනු වෙනුවට විවිධ වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදනය කරන ලද වත්කම් ප්‍රාග්ධනිත කිරීමේදී විවිධ ගිණුම්කරණ ප්‍රතිකර්ම ව්‍යාපෘතිය විසින් යොදා ගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් රු.මිලියන 294.67 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද හා කොන්ත්‍රාත්කරුවන්ගේ නමින් ලියාපදිංචි කරන ලද මෝටර් වාහන 37 ක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගතකර තිබූ අතර රු.මිලියන 15.71 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමින් ලියාපදිංචි කරන ලද මෝටර් වාහනයක් දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 නොසැසඳූ ශේෂ

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට වියපැහැදම් කරන ලද මුදල රු.මිලියන 1,983.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 1,954.40 ක ශේෂය සමඟ එය ගැලපී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය කිරීම සඳහා ප්‍රදාන / ණය ගිවිසුම්වල එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 131.50 | 16,595.30 | 7,200.00 | 12.12 | 1,741.70 | 13.00 | 1,954.40 |
| ශ්‍රිලංර | 68.50 | 8,644.70 | - | - | - | - | - |
| ලංවිම | - | - | 2,958.00 | 3.41 | 490.00 | 5.00 | 759.00 |
| එකතුව | 200.00 | 25,240.00 | 10,158.00 | 15.53 | 2,231.70 | 18.00 | 2,713.40 |

ඉහත තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 75 ක් ඉකුත්වී තිබුණද, එජඩො මිලියන 131.50 ක් වූ ණය සහ ප්‍රදාන වෙන්කිරීමෙන් සියයට 11.8 ක් නියෝජනය වන එජඩො මිලියන 13 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව, පහත විස්තර දැක්වෙන පරිදි ව්‍යාපෘතියේ භෞතික කාර්යයන් 2015 දෙසැම්බර් 31 දිනට මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(අ) වැඩ විෂය පථය වෙනස් කිරීම් හා මහජන උද්ඝෝෂණ හේතුවෙන් මන්නාරම සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වවුනියා හා මන්නාරම උපපොළවල සිවිල් ඉදිකිරීම් වැඩ සහ අනුරාධපුරය සිට වවුනියා හා මන්නාරම දක්වා සම්ප්‍රේෂණ රැහැන් සංවර්ධනය කිරීම මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(ආ) පාදුක්ක හා කෑගල්ල විදුලි බල සම්ප්‍රේෂණ රැහැන් හා නව පොල්පිටිය විදුලි බල සම්ප්‍රේෂණ රැහැන් සංවර්ධනය කිරීම් වැඩ යටතේ සිවිල් ඉදිකිරීම් වැඩ පිළිබඳ කොන්ත්‍රාත්තු ප්‍රමාදයන් සහිතව භාරදී තිබු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම සිවිල් ඉදිකිරීම් වැඩ 2015 දෙසැම්බර් 31 දිනට ආරම්භක අදියරයන්හි පැවතුණි.